නිරූපිකාවක් වන එකම දියණිය, අතිහිටවු සිර දඬුවමක් විඳින ''තැඹිලි'' ව්‍යාපාරික සැමියා හා එක්ව මැර බලයෙන් හා කොමර්ෂල් බැංකුව සම්බන්ධ කරගෙන කූඨ ලෙස නිවස හා ඉඩම කොල්ලකන්නට දරන උත්සහය සම්බන්ධයෙන් මව පොලිස්පතිට මෙන්ම බැංකුවට කරුණු දක්වා තිබේ.

ඇය බැංකුව ට ඉදිරිපත් කර තිබෙන කරුණ දැක්විම ඇතුලත් ඉල්ලීමේ උද්ධෘතයන් පහත දක්වන්නේ, සිද්ධිය සම්බන්ධයෙන් අදහසක් ඇති කරගන්නට පහසුව පිණිසය.

- දැනට තම නමට එන ලිපියක්වත් දියණිය ලබා නොදෙන නිසා, ඇය තාව කාලික ලිපිනයක් බැකුවට ලබා දි තිබේ.
- ගාල් පාරට නුදුරින් පිහිටි, වත්මන් වටිනාකම, රුපියල් ලක්ෂ සියයක් (10,000,000/=) වන පර්චස් 15 ක ඉඩම හා නිවස, 2017 දි කොමර්ෂල් බැංකුවෙන්, රුපියල් ලක්ෂ අටක (රුː 800000/= ) ණය මුදලක් ලබා ගැනීමට, දියණියගේ සැමියා ඇපකරු වශයෙන් ඉදිරිපත් ව තිබේ.
- නිවස හා ඉඩමේ හිමිකරු වන මව, ඇප කාරිය වෙ. එම ඉඩමේ හා නිවසේ ණයකරු හා දියණිය බලහත්කරයෙන් පදිංචි වී සිටි.
- ණයකරු මි වන විට ණය මුදල පියවීම, මගහැර තිබේ.
- මාස කිහිපයකට පෙර, බැංකුව ණය මුදල පියවීම මග හැර ඇති බවට ණයකරුට හා ඇපකාරියට පොදු ලිපියක් එවා තිබේ.
- එම ලිපිය, ණයකරු බලහත්කාරයෙන් ලබාගත් නිසා, මැය බැංකුව වෙත ගොස් විස්තර විමසා තිබේ.
- බැංකුවේ අදාළ අංශයේ නිලධාරී, ණයකරු රුපියල් ලක්ෂ හයකට වැඩි ප්‍රමාණයක් ගෙවීමට ඇති බවත්, එය ගෙවා, 'ඇපයෙන් ' නිදහස් වෙන ලෙසට ඇපකාරියට කියා තිබේ.
- ණයකරු, ණය මුදල නොගෙවන බව කියා සිටින අතර, මැයට හා සැමියාට මරණීය තර්ජණය කරමින්, ශාරීරික වධ හිංසා කිරීමට පටන් ගෙන තිබේ.
- ණය මුදල ලබාගත්, පුද්ගලයා, තමා ණය මුදල නොගෙවන බවට කියා සිටින අතර, මැයටත්, මැයගේ සැමියාටත් මරණීය තර්ජණය කරමින්, ශාරීරික හිංසා කිරීමට පටන් තිබේ.
- මෙම පසුබිම යටතේ, මැය ඇපකරු වශයෙන්, ණය ලබාදිමෙදි, ගත් ණය මුදල අදාළ ගිවිසුමේ/ඔප්පුවේ සහතික පිටපතක් බැංකුවේ අදාළ නිලධාරී ගෙන් ඉල්ලා තිබේ.
- එම නිලධාරී, උදේ වරුවක පැමිණෙන ලෙසට මැයට දැනුම් ලදි.
- ඒ අනුව, මැය 2024.04.24 දින, උදේ 10ට, නිලධාරී මුණගැසුනු විට, ඔහු, කටින් ඉල්ලුවාට බැහැ, ලිඛිත ඉල්ලීමක් කරන ලෙසට මැයට දැනුම් දි තිබේ.
- එදින ප.ව. 05.20ට පමණ, කොමර්ෂල් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ රිකවරි අංශයේ නිලධාරියෙක් කථා කර හිඟ මුදල නොගෙවීම නිසා නඩු දමා ඇති  බව පවසා තිබේ.
- මා ඔහුගෙන්, නඩු දමා ඇති නම්, අංකය, උසාවිය ආදී තොරතුරු ලබාදෙන ලෙසට ඉල්ලා සිටියා. එවිට ඔහු කියා සිටියා, තාම දාලා නැහැ, ඒ අදාළව කටයුතු කරගෙන බව.
- මැය පසු දින එම නිලධාරිට කතා කර නුඩු දම තිබේ නම් විස්තර ඉල්ලා සිටි විට, නඩු දන්න සුදනම් වෙනවා යයි කියා තබේ.
- මේ පසුබිම යටතේ, වත්මන් වටිනාකම රුපියල් ලක්ෂ සියයක් වටිනා නිවස හා ඉඩම, රුපියල් ලක්ෂ අටක ප්‍රමාණයකට හිලව් කර දිය නොහැකි බව අවධාරණය කරන මැය, ණය මුදල හා සම්බන්ධයෙන්, තමා ඇප කරු වශයෙන් අත්සන් කරන තිබෙන් ගිවිසුමේ (ඔප්පුවේ), සහතික පිටපත ලබා දෙන ලෙසට බැංකුවෙන් ඉල්ලා සිටි.
- 2017 දීත්, රුපියල් ලක්ෂ පනහකට වැඩි වටිනාකමකින් යුත් ඉඩම හා නිවස, බැංකුව මගින්, තක්සේරු කර ඇත්තේ රුපියල් ලක්ෂ විස්සකට බව, තමාට දැනගන්නට ඇතැයිද මැය කියා සිටි.
- ණයකරු, අදාළ කිසිදු ලේඛනයක්, ලියවිල්ලක්, ලිපියක් මැයට ලබා නොදෙන බවද, මරණිය තර්ජන කරමින් පහර දෙන බව අවධාරණය කරන මැය මුදල් අයකර හෝ අදාළ ගිවිසුමේ (ඔප්පුවේ) සහතික පිටපතක් ලබා දීමට පියවර ගන්නා මෙන් බැංකුවෙන් ඉල්ලා සිටි.